**මිනිපේ ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 23 ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මිනිපේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අත්තිකාරම් ගිණුමේ රු.44,137 ක හර ශේෂය බැර ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුවේ. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.51,666,689 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.238,285 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | මෙම වෙනස්කම් පිළිබඳ සොයා බලා ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.10,008,523 ක් වූ අතර, වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.5,214,491 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වසර 1-5 ත් අතර ශේෂයෙන් රු.612,545 ක් ලැබී ඇති අතර, ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) වසර 1 - 5 ත් අතර ගෙවිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව රු.5,179,475 ක් වූ අතර, වසර 5 ක කාලයක් ඉක්මවා තිබුණු ශේෂය රු.2,459,906 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | වසර 5 ට අඩු ශේෂයන් රු.646,598 ක මුදලක් ගෙවා ඇති බවත්, ගෙවිය යුතු ශේෂ ගෙවීමට හා අනුමැතිය ලබාගෙන කපා හැරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.124,303,547 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාළව අයිතිය සනාථ කරන පැවරුම් නියෝග, ලිපිගොනු හා ලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී සාක්ෂි ඉදිරිපත් කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 126 වගන්තිය | දැන්වීම් පුවරු 2 කින් රු.57,125 ක ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි. | වර්ෂයේ ආරම්භයේ සමීක්ෂණය කර ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ මුදල් අය කර විගණනයට වාර්තා කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 149 වගන්තිය | ගුරුලුපොත තානායමෙන් සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කරන ගිණුම් වාර්තා මත සියයට 1 දක්වා වූ බලපත්‍ර ගාස්තුව අයකරගෙන නොතිබුණි. | සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කරන ගිණුම් වාර්තා මත ආදායම ලබාගත යුතු වේ. | වරලත් ගණකාධිකාරී වරයෙකුගේ වාර්තාව මත සියයට 1 ක් ලබාගෙන ඇත. විගණනයෙන් පෙන්වූ පසු එම උපදෙස් අනුව කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ඇ) | 2018 අප්‍රේල් 24 දිනැති අංක 2018/04 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොගෙන සභාව සතු වාහන 2 ක් රු.562,021ක වටිනාකමකට අලුත්වැඩියා කර තිබුණි. | අලුත්වැඩියාව සිදු කිරීමට පෙර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යොමුකර ඇති බව දන්වමි. |
| (ඈ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:4:3 හා 2:8:1 ඡේදය | ළමා උද්‍යානයට රු.2,361,036 ක් වටිනා ක්‍රීඩා උපකරණ මිලදී ගැනීමේ තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා පළාත් පාලන ඉංජිනේරුවරයා සහභාගී වී නොතිබුණු අතර, තාක්ෂණ ඇගයීම් කමිටුවට විෂය දැනුමැති නිලධාරියෙකු සහභාගී කරගෙන නොතිබුණි. | තාක්ෂණික කමිටුවට පත් කළ නිලධාරීන් සහභාගී කරගත යුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සහභාගීවන ලද්දේ ගණකාධිකාරිවරයා පමණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,316,477 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,860,375 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,365,804 | 1,381,450 | 785,727 | 595,723 | 1,332,892 | 1,332,892 | 929,810 | 403,082 |
| (ii) | කුලී | 4,845,222 | 5,128,148 | 1,613,208 | 3,514,940 | 3,280,589 | 3,919,412 | 2,338,827 | 1,580,585 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,233,725 | 2,009,579 | 1,963,229 | 46,350 | 2,510,000 | 2,312,897 | 2,312,897 | - |
| (iv) | වෙනත් ආදායම් | 3,979,500 | 6,790,184 | 4,190,464 | 2,599,720 | 5,624,041 | 32,838,739 | 31,305,060 | 1,533,679 |
| | | 12,424,251 | 15,309,361 | 8,552,628 | 6,756,733 | 12,747,522 | 40,403,940 | 36,886,594 | 3,517,346 |

## 2.2.2 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හසලක නගරයේ අධිකරණ සංකීර්ණයක් පවත්වාගෙන යෑමට දුන් ගොඩනැගිල්ලෙන් 2001 වර්ෂයේ සිට ලැබිය යුතුව තිබූ රු.103,500 ක මුදල අයකර නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | වැලි තොටුපල බදු දීමෙන් පුද්ගලයන් දෙදෙනෙකුගෙන් 2008 ජූලි 01 සිට 2008 දෙසැම්බර් 31 දක්වා කාලයට අය විය යුතු රු.81,949 ක බදු මුදලක් අයකර නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හසලක පොදු වෙළඳපල - පොළ පාර කඩ කාමර 4 කින් රු.839,834 ක කඩ කුලියක් අයවිය යුතුව තිබුණි. | අයවිය යුතු කුලී නිසි කලට අයකර ගත යුතු වේ. | නඩු නිෂ්ප්‍රභා වී ඇත. සන්තකය පවරාගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ඈ) | පොදු වෙළඳපල - පල්ලේවත්ත කඩ කාමර 4 කින් රු.543,999 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. රු.110,523 ක කඩ කාමර කුලී අයකර ගැනීමට නඩු පවරා තිබුණි. | අයවිය යුතු කුලී නිසි කලට අයකර ගත යුතු වේ. | නඩු නිෂ්ප්‍රභා වී ඇත. සන්තකය පවරාගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හසළක වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 20 කින් රු.5,273,827 ක බදු මුදලක් අයවිය යුතුව තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර මුදල් අයකර ගත යුතු වේ. | සන්තකය පවරා ගැනීමට නඩු පවරා ඇති බව දන්වමි. |
| (ඊ) | හසලක නගරයේ ඇති හෝරස්ථම්භ බිම් මහලේ ඇති ලොතරැයි අළෙවි කුටියෙන් 2016 වර්ෂයේ සිට අය විය යුතු රු.113,250 ක හිඟ කුලියක් විය. | මෙම මුදල් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරු කර නැවත ගිවිසුම්ගත වන ලෙස දැනුම් දී ඇති බව දන්වමි. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.20,931,160 ක් හා මුද්දර ගාස්තු රු.651,650 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 13 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.59,078,700 ක් වැය කර ඉදිකළ බහුකාර්ය ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට යෝජිත මහජන පුස්තකාලය, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, සෞඛ්‍ය මධ්‍යස්ථානය, මාතෘ හා ආයුර්වේද මධ්‍යස්ථානය හා ප්‍රජා ශාලාව යනාදිය ස්ථාපිත කර නොතිබුණු අතර, 2019 දෙසැම්බර් 31 දින වන විටත් බිම් මහලේ හා දෙවන මහලේ වර්ග අඩි 14000 ක ප්‍රමාණය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් දිරන කසළ කට්ටි ක්‍රමය අනුව කොම්පෝස්ට් නිෂ්පාදනය කර තිබුණද, අලෙවි කිරීම සඳහා නිසි සැලසුමක් නොතිබීම හේතුවෙන් විශාල කොම්පෝස්ට් ප්‍රමාණයක් ගොඩගසා තිබුණි. හැලීමට සුදුසු තත්ත්වයේ පොහොර වැස්සට නිරාවරණය කර තිබූ අතර, නිෂ්පාදිත හා විකුණන පොහොර ප්‍රමාණ ලේඛනගත කර නොතිබුණි. | විධිමත්ව කසළ කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | කසළ අංගනයට පොහොර ගෙනවිත් වර්ග කරන බව දන්වමි. නිෂ්පාදනය කරන පොහොර හැලීමට හැකි පරිදි සකස් කරන බව දන්වන අතර ලේඛනගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ප්‍රමාණවත් අයුරින් හඳුනාගෙන නොමැති අතර, එම නිසා ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටු කර නොමැත. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2020 අයවැය සමඟ තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | හසලක වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු දීමට අදාළ ගිවිසුම් 2009 වර්ෂයේදී අවලංගු වී තිබුණි. ගිවිසුම් අනුව කඩ කාමරයක ප්‍රමාණය අඩි 12x29 වුවද, අඩි 12x60 වන පරිදි අනවසරයෙන් ඉදිකිරීම් සිදුකර තිබූ අතර, කඩ කාමර 13 ක බදුකරුවන් කඩය පිටුපස ස්ථිරව පදිංචි වී තිබුණි. වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ කඩ කාමර සභාවේ අවසරයකින් තොරව බදුකරුවන් විසින් ඉදිකර තිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | පල්ලේවත්ත පොදු වෙළඳපල කඩ කාමර 2 කින් රු.367,887 ක් හා හසලක පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 2 කින් රු.512,224 ක් අයකර ගෙන නොතිබුණු අතර, මේ සම්බන්ධව නඩු දමා ඇතත්, බදු ගිවිසුමේ කාලය අවසන් බැවින් නඩු නිෂ්ප්‍රභා වී තිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට හා සන්තකය පවරා ගැනීමට නීත්‍යානුකූල කටයුතු කළ යුතු වේ. | කාලාවරෝධය නිසා නඩු නිෂ්ප්‍රභා වී ඇත. සන්තකය ආපසු ගැනීමට නඩු පැවරීමට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව දන්වමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තනතුරු 7 ක පුරප්පාඩු 10 ක් හා එක් තනතුරක අතිරික්ත 02 ක් පැවතුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. | පිළිගනිමි. පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 4 දෙනෙකුගෙන් රු.500,973 ක ණය ශේෂය නිරවුල් කරගෙන නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු බීමහල තක්සේරු නොකර වර්ෂ 6 ක සිට බදු දී තිබුණි. | තක්සේරු කර බදු දීමට කටයුතු කළ යුතු වේ. | මෙම කඩ කාමරය මෙතෙක් තක්සේරු කර නොමැති අතර, 2021 වර්ෂයේ තක්සේරු කර ටෙන්ඩර් කරන බව දන්වමි. |
| (ආ) | ජලය බෙදා දීමේ වැඩසටහනක් වෙනුවෙන් වැය වූ රු.98,757 ක මුදල මිනිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාලීනව මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම. | මෙම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ලිපි යොමු කර ඇත. |
| (ඇ) | සභාව සතු ජල ව්‍යාපෘතිවල ජලමනු සවි නොකර ගෘහස්ථව රු.150 ක් හා ව්‍යාපාරිකයින්ගෙන් රු.400 ක් අය කිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබූ අතර ජලය නොලැබෙන බව දන්වා මුදල් නොගෙවීම මෙන්ම කාලීනව ජල ගාස්තු අය නොකිරීම හේතුවෙන් රු.2,522,169 ක හිඟයක් පැවතුණි. | ජලමනු සවිකර ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | ජලමනු සවි කිරීම නොකිරීම පිළිබඳ තොරතුරු සභාවේ නැත. ජලමනු සවි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හසලක සතිපොළට යාබදව සභාව සතු ඉඩමක පුද්ගලයෙකු අනවසරයෙන් ඉදිකළ ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට අදාළ නඩුව සමථයකට පත් කිරීමට සභාව විසින් 2019 සැප්තැම්බර් 25 දින රු.535,500 ක් ගෙවා තිබුණි. මෙම නඩුවටම අදාළව අධිකරණ භාරයට ගෙන තිබූ සභාව සතු රු.1,500,000 ක් වටිනා කැබ් රථයක් දිරාපත් වෙමින් පැවතුණි. | වත්කම් වල ආරක්ෂාවට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධව පොලීසියට වාර්තා කර ඇත. ඉදිරි කටයුතු කර වාර්තා කරන බව දන්වා ඇත. |

### 3.5.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාත් සභාවෙන් ලබාදී තිබුණු රු.1,500,000 ක් වටිනා කැබ් රථය 2006 වර්ෂයේදී ඇස්කීසි නියෝගයක් මත තහනමට ලක්කර තිබූ අතර, නඩුව මේ වන විට නිමවී ඇතත් කැබ් රථය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම කැබ් රථය සම්බන්ධයෙන් කඩිනමින් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මේ සම්බන්ධ පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති බව දන්වමි. |
| (ආ) | රු.1,978,050 ක් වටිනා වාහන 03 ක් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | ප්‍රයෝජනයට ගත නොහැකි වාහන වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත් කර ඇතත්, සාමාන්‍ය කාර්යාල කටයුතු පැවරීම හේතුවෙන් අභ්‍යන්තර විගණනය ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය සිදු කර වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි. |